# දෙවන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ව්‍යාපෘතිය පිළිබඳ ක්ෂේත්‍ර අත්දැකීම්

1979 වසරේදී හඳුන්වා දෙනු ලැබූ ශ්‍රී ලංකාවේ පළමුවන කෘෂිකර්ම ව්‍යාප්ති සේවාව වන "පුහුණුවීමේ හා හමුවීමේ" ක්‍රමයෙන් අනතුරුව 1993 දී හඳුන්වා දුන් ව්‍යාප්ති සේවාව දෙවන කෘෂිකර්ම ව්‍යාප්ති සේවා ව්‍යාපෘතියයි. මෙය ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ සිව් අවුරුදු ව්‍යාපෘතියකි. මෙහි ප්‍රධාන අරමුණු ලෙස පෙන්වා දී ඇත්තේ නව තාක්‍ෂණය භාවිතයෙන් ගොවිපළ ඵලදායකත්වය වැඩිකිරීම තුළින් නිෂ්පාදනය සහ ගොවියාගේ ආදායම ඉහළ නැංවීමයි.

දෙවන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ව්‍යාපෘතිය ගොවියාගේ අවශ්‍යතා මත පදනම් වූ ක්‍රමයක් මිස, ඉහළ සිට පහළ මට්ටමට යොමුවූ විධායක ක්‍රමයක් නොවන බව හඳුන්වාදී ඇත.

මෙම ව්‍යාප්ති සේවාව ප්‍රධාන සංකල්ප කිහිපයක් මත පදනම් වී ඇත. එනම් ඒකාබද්ධ කෘෂිකර්ම ව්‍යාප්තිය, යොමුගත ගොවි කණ්ඩායම්, ගැටළු හඳුනාගැනීම සහ විසඳීම, ක්ෂේත්‍ර ව්‍යාප්ති කණ්ඩායම්, ක්ෂේත්‍ර ව්‍යාප්ති බල ප්‍රදේශ ආදිය ඉන් කිහිපයකි.

විවිධ කෘෂිකාර්මික සේවා සම්බන්ධයෙන් පිහිටුවා ඇති ආයතන හතරක ක්‍රියාකාරී සහභාගිත්වය සහිතව ඉහත ඒකාබද්ධ කෘෂිකාර්මික වැඩසටහන් දියත් කෙරේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා පොල් වගාකිරීමේ මණ්ඩලය මෙම ආයතන හතරවේ.

### ක්ෂේත්‍ර මට්ටමේ ක්‍රියාකාරිත්වය

එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුළ පවතින සියලුම ගොවිජන සේවා බල ප්‍රදේශවල උප කොට්ඨාශ මට්ටමින් ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක වේ. එක් ගොවිජන සේවා බල ප්‍රදේශයක් තුළ සිටින ඉහත ආයතන 04 යටතේ වූ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් සංඛ්‍යාව අනුව උප කොට්ඨාශ එනම් ක්ෂේත්‍ර ව්‍යාප්ති බල ප්‍රදේශ නිර්ණය කෙරේ. එක් උප කොට්ඨාශයක් එක් ක්ෂේත්‍ර නිලධාරියෙකුට භාර වන අතර, ගොවිජන සේවා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන මෙම කණ්ඩායම ක්ෂේත්‍ර ව්‍යාප්ති කණ්ඩායම (FET TEAM) ලෙස හැඳින්වේ. මෙම කණ්ඩායමට ඉහත දැක්වූ ආයතන 04හි අධීක්ෂණ නිලධාරීන්ගෙන් සමන්විත මහ පෙන්වීමේ කණ්ඩායමක් (GET TEAM) මගින් මඟ පෙන්වීම සිදුකරයි. මෙම වැඩසටහන මූලික වශයෙන් ගොවි ගැටලු හඳුනා ගැනීම, ඒවා විසඳීම මුල්කර ගත් වැඩසටහනක් ලෙස හඳුන්වා දිය හැක. ගොවිගැටලු හඳුනා ගැනීමට ක්ෂේත්‍ර ව්‍යාප්ති කණ්ඩායමේ(FET) නිලධාරීන් විසින් තම උප කොට්ඨාශය තුළ ගොවි කණ්ඩායම් තෝරා ගත යුතුය. මෙම ගොවි කණ්ඩායමක් "යොමුගත ගොවි කණ්ඩායම" (FRG)ලෙස හඳුන්වයි. එක් ක්ෂේත්‍ර නිලධාරියෙකු තම උප කොට්ඨාශය තුළ යොමුගත ගොවි කණ්ඩායම් 8-10 ත් අතර ප්‍රමාණයක් පිහිටුවිය යුතු බවට මේ නිලධාරීන්ට උපදෙස් දී ඇත. මෙම යොමුගත ගොවි කණ්ඩායම්වල ප්‍රශ්න හඳුනා ගෙන ඒවාට විසඳුම් ලබා දීමට කටයුතු කළ යුත්තේ මෙම නිලධාරීන්ගේ රේඛීය දෙපාර්තමේන්තුවල රාජකාරී හා වගකීම්වලට අමතරවයි.

සංඛ්‍යාන සහකාර

එස්. ඇපාසිංහ විසිනි.

යොමුගත ගොවි කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන පුළු, ක්‍ෂණික විසඳුම් ලබා දිය හැකි ගැටළු විසඳීම, රැස්වීම් වාරය තුළදීම සිදු කරනු ලැබේ. එසේ නොහැකි ගැටලු ප්‍රමුඛතාව අනුව සකස් කරනු ලබයි. සති දෙකකට වරක් කාර්යාල දිනයේදී රැස්වන මෙම කණ්ඩායම එම ගැටලුවලට

විසඳුම් සාකච්ඡා කරන අතර, එසේ නොහැකි ගැටලු මඟ පෙන්වීමේ කණ්ඩායම (GET) වෙත හා ඉන් ඉහළ තීරණ ගන්නා නිලධාරීන් වෙත ඉදිරිපත් කරයි

**ක්ෂේත්‍ර අත්දැකීම්**

ක්ෂේත්‍ර අත්දැකීම් ලද දිස්ත්‍රික්ක අතර අනුරාධපුරය, හම්බන්තොට, බදුල්ල ගම්පහ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක විය. මේ දිස්ත්‍රික්කයන් පහ තුළ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම එක් ගොවි ජන කේන්ද්‍රයක ක්ෂේත්‍ර ව්‍යාප්ති (FET) නිලධාරීන් දෙදෙනෙකු සහ යොමුගත ගොවි කණ්ඩායමේ (FRG) සාමාජිකයින් තුන් දෙනෙකු සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබිණ. මෙම වැඩසටහන ආරම්භ කිරීමේදී ගොවීන් රැස් කර, (එනම් යොමුගත ගොවි කණ්ඩායම), ඔවුනට පෑන්, පැන්සල් සහ කොළ කැබලි ලබාදී තමනට ඇති ගැටලු ලියාදීමට ගොවීනට උපදෙස් දී ඇත. මේ නිසාම ගොවීහු මේ වැඩසටහන පෑන්, පැන්සල්, කොළ කැබලි දුන් වැඩසටහනක් ලෙස හඳුන්වනු ලබති.

**මේ වැඩ සටහනේ මූලික සංකල්ප පිළිබඳ ගොවීන් අතර මනා අවබෝධයක් නැති බව බොහෝ අවස්ථාවලදී දක්නට ලැබුණි. ගැටලු සංගණන ක්‍රියාදාමයේදී එක් එක් ගැටළුව ඉදිරිපත් කරන ලද ගොවි සංඛ්‍යාව මත පදනම් වෙමින් ගැටලුවල ප්‍රමුඛතා අනුපිළිවෙල සැකසේ. සෑම ස්ථානයකම පාහේ සිදුවී ඇත්තේ හඳුනා ගනු ලැබූ ප්‍රධාන ගැටලු මේ ක්ෂේත්‍ර ව්‍යාප්ති (FET) නිලධාරීන්ට විසඳීමට නොහැකි ඒවා වීමයි. ජල හිඟය, ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්න, පොහොර සහනාධාර ක්‍රම නැවත හඳුන්වාදීම, පොහොර මිල අඩු කිරීම, ණය ලබාදීම වැනි ප්‍රශ්න මූලිකව එයි.** මෙවැනි මූලික ප්‍රශ්න විසඳීමට අවශ්‍ය තීරණ ගැනීමට හා වැඩසටහන් සම්පාදනය කර දියත් කිරීමට FET මට්ටමේ නිලධාරීන්ට හැකියාවක් නැත. FET නිලධාරීහු මේ ප්‍රශ්න පිළිබඳ ඉහළ මට්ටමේ නිලධාරීන්ට දැන්වූ බව ගොවීන්ට සැළ කරති.

තමනට විසඳිය හැකි ප්‍රශ්න පුහුණු පන්ති වැනි ගොවීන් දැනුවත් කිරීම් තුළින් විසඳීමට උත්සාහ කරන මෙම නිලධාරීහු අනෙකුත් ගැටලු ඉහළ ස්ථාන කරා දැනුවත් කරති. මෙම ව්‍යාප්ති සේවාවේ දක්නට ලැබුණු මූලිකම ගැටලුව වූයේද එවැනි ගැටලු සඳහා විසඳුම් ලබා දීමට කෘෂි ව්‍යාප්ති සේවය සමත් නොවීමයි.

ගොවීන්ට අවශ්‍ය වන්නේ ඉහත සඳහන් කළ මූලික ගැටලුවලට විසඳුමය. මෙවැනි විසඳිය හැකි ප්‍රශ්න පවා අදාළ ආයතන වෙත යොමු කළ පසුවත් ක්‍රියාත්මක විසඳුම් නොලැබුණ අවස්ථා එමටය. මේ තත්ත්වයන් නිසා ගොවීන් හා ක්ෂේත්‍ර ව්‍යාප්ති කණ්ඩායමේ (FET) නිලධාරීන් අතර සම්බන්ධතාව, බැඳීම බොහෝ දුරට පලුදු වී ගිය බව සමහර නිලධාරීන්ගේ මතය විය. එබැවින් ගොවීන් හමුවට යාමේදී ක්ෂේත්‍ර නිලධාරීහු අසරණ වෙති. සමහර ගොවීන්ගේ අදහස වූයේ පුහුණු කටයුතු ඔවුනට අවශ්‍ය නොවන බවත් මූලික ප්‍රශ්න විසඳන්නේ නම් කෘෂිකාර්මික කටයුතු වඩාත් සාර්ථකව සිදුකර ගත හැකි බවත්ය.

මෙම දෙවන කෘෂිකාර්මික ව්‍යාප්තිසේවයේ දක්නට ලැබුණ දුර්වලතා කිහිපයක් පෙන්වා දිය හැකිය.

1. ගැටලු ඉදිරිපත් කිරීමේදී අකුරු ලිවීමට බැරි අයට තම ගැටලු ඉදිරිපත් කිරීමට අවකාශ නොලැබීම.
2. ගොවීන්ගේ මූලික ප්‍රශ්න හඳුනා ගත්තද, ඒවාට විසඳුම් ලබා නොදීම.
3. මූලික ප්‍රශ්නවලට විසඳුම් ලබා නොදීම නිසා සහ වෙනත් විවිධ හේතුමත ගොවි සහභාගිත්වය අඩුවීම.
4. සමහර නිලධාරීන් නියමිත යොමුගත ගොවි කණ්ඩායම් සංඛ්‍යාව සංවිධානය කිරීමට අසමත් වීම.
5. ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් හා දිරිදීමනා කලට වේලාවට සැපයීමේ දුර්වලතා.

6. සමහර FET නිලධාරීන් තමනට විසඳිය හැකි ප්‍රශ්න වුවද විසඳීමට තරම් උනන්දු නොවීම.
7. තම රේඛීය ආයතනයේ රාජකාරිද මේ සමඟ ඉටු කිරීමට ඇති නිසා යොමුගත ගොවි කණ්ඩායම් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමට කාලය මදිවීම.
8. සමහර නිලධාරීන්ගේ ක්ෂේත්‍ර ව්‍යාප්ති බල ප්‍රදේශය විශාලවීම.
9. ක්ෂේත්‍ර ව්‍යාප්ති (FET) නිලධාරීන්ගේ රාජකාරි අගය කිරීම සහ විදේශ ශිෂ්‍යත්ව ලබාදීම පිළිබඳ අක්‍රමිකතා.

**එහෙත් මෙම ව්‍යාපෘති සංකල්පයේ ප්‍රයෝජනවත් බව ද සුළු පටු නොවන්නේය. ගොවීන්ගේ මූලික කෘෂිකාර්මික ප්‍රශ්නවලට ප්‍රමාණවත් විසඳුම් ලබාදීමට තරම් මෙම සේවය සමත් නොවුනද, නිලධාරීන් හා ගොවීන් අතර මනා සබඳතාවක් වර්ධනය කිරීමට තරම් එය සේවයක් සලසා ඇත. ගොවීන්ගේ දැනුම වර්ධනය කර ගැනීමට මෙය බොහෝ සෙයින් ඉවහල් වී ඇත. නිලධාරි හිඟයට විකල්පයක් වූ මේ ව්‍යාපෘතිය මඟින් එක් රේඛීය දෙපාර්තමේන්තුවක් යටතේ වූ නිලධාරියෙකුගෙන් වෙනත් දෙපාර්තමේන්තුවලට අදාළ සේවය පවා ලබා ගැනීමට හැකිව තිබේ. සියලුම ක්ෂේත්‍ර ව්‍යාප්ති (FET) නිලධාරීන්ට රේඛීය ආයතන 04 තුළම ක්‍රියාකාරීත්වය පිළිබඳව පුහුණුවක් ලබාදීම මෙයට හේතුවයි.**

**ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වූ ඇත්තුරියම් මල් වගාව මෙම ව්‍යාප්ති සේවාව යටතේ කාන්තාවන් වෙනුවෙන් ඉටු කරන ලද මහඟු සේවයකි. මේ මල්පැල වගාව අලෙවි ප්‍රශ්න මත තරමක් දුරට බිඳ වැටුනත් අගය කළ යුත්තකි. ගොවීන්ට විශාල සේවයක් සැලසූ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හල්දුම්මුල්ල ගොවිජන සේවාවේ ගම්මිරිස් මහත්මයා වැනි නිලධාරීන්ද මෙහිදී විශේෂයෙන් මතක් කළ යුතුය. ගොවීන්ට විශේෂ පුහුණු පන්ති, වගා ආදර්ශන, මල් වගාව, කාබනික පොහොර භාවිතය, සත්ත්ව පාලන උපදෙස්, පොල්පැල ලබාදීම වැනි ගොවීන් වෙනුවෙන් විශාල මෙහෙයක් කළ නිලධාරීන්ගේ සේවය මෙහිදී අගය කළ යුතුය.**

බොහෝ ක්ෂේත්‍ර ව්‍යාප්ති (FET) නිලධාරීන්ගේ මතය වූයේ තමන්ට ඉහළ නිලධාරීන් මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට එතරම් සහයෝගයක් ලබා නොදෙන බවයි. ඒ නිලධාරීන්ගේ අවධානය ලැබ මෙම ගැටලු පිළිබඳ වැඩි අවධානයක් යොමු කළේ නම් දෙවන කෘෂිකාර්මික සේවා ව්‍යාපෘතියේ සාර්ථකත්වය මීට වඩා ඉහළ තත්ත්වයක පැවතීමට ඉඩ තිබිණි.

සමස්ථයක් ලෙස බලන විට ශ්‍රී ලංකාවේ ගොවීන්ට සේවයක් සැලසිය හැකි වැඩසටහනක් ලෙස දෙවන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා ව්‍යාපෘතිය (SAEP) හැඳින්විය හැකිය. නමුත් මේ වැඩසටහන පිළිබඳ ගොවීන් ප්‍රමාණවත් පරිදි දැනුවත් කරනු දක්නට නොලැබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස එවැනි ව්‍යාප්ති සේවාවක් මෙරට දියත් වූ බව නොදන්නා පිරිස අධිකය. එක් එක් රේඛීය දෙපාර්තමේන්තුවලට අනුබද්ධ හුදකලා ව්‍යාප්ති සේවාවන් හැරුණු කොට දැනට ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍ර බෝග නිෂ්පාදන අංශය තුළ ඉහත පරිදි සංවිධානය වූ කෘෂිකර්ම ව්‍යාප්ති සේවයක් දක්නට නැත. ශත වර්ෂයකට ආසන්න කාලයක් සුළු ගොවියා වෙත නොමිලයේ තම සේවය ලබා දුන් කෘෂි ව්‍යාප්ති සේවයද, වාණිජකරණය වීම තුදුරු අනාගතයේදී බලාපොරොත්තු විය හැකිය.

එහෙත් කුමන අන්දමේ ව්‍යාප්ති සේවාවක් ඉදිරියේදී ක්‍රියාත්මක වුවද එම සේවාව වඩාත් සාර්ථකව සපයාදීම සඳහා දෙවන කෘෂිකර්ම ව්‍යාප්ති සේවා ව්‍යාපෘතියෙන් උගත හැකි පාඩම් බොහෝය.